

# කොඩියගෙ ළමා

ලක්ෂමන් කොඩිතුවක්කු

ලොවේ සියලුම බලවතුන් නොනවතින බල අරගලයක යෙදී, යුද්ධය, න්‍යෂ්ටික අවි ඇතුළු පරමාණු බෝම්බ ගැන කතා කරන මොහොතක, එම නායකයන් ඇතුළු සමස්ථ ලොව ජනතාවටම ඔක්සිජන් සපයන ඇමසන් වනාන්තරය ගින්නෙන් දැවෙමින් පවතී. වර්ග කිලෝ මීටර් මිලියන පහ මාරක් පමණ විශාල වපසරියකින් යුත් ඇමසන් වනාන්තරය විවිධ ජෛව විවිධත්වයකින් යුත් ශාක හා සතුන්ගෙන් ගහණ නිල්ල පිරුණු හරිත වනයකි. එසේම බොහෝ ඖෂධ වලට අවශ්‍ය කරන ශාක වර්ග නිරතුරුවම එහි වැවෙයි. අපා, දෙපා, සිව්පාවන්ගෙන් පිරි, බ්‍රසීලයේ සිට කොලොම්බියාව තෙක් විහිදී ඇති මෙම හරිත පද්ධතියට අද වනවිට අත් වී ඇති ඉරණම ඉතා භයානක වේ. එය ශෝචනීය වූ පරිසරයට ආදරය කරන දෑස්වලට කඳුලක් ගෙනදෙන ඉරණමකි. එසේම ලොවේ බොහෝ රටවලට අවශ්‍ය කරන දැව බඩු සෑදීම සඳහා වටිනා මහෝගනී වැනි ගස් වැවෙන, වනයක් වූ ඇමසන් මේ වනවිටත් ගින්නෙන් දැවෙන්නේ එහි වටිනාකම දැන, එය ආරක්ෂා කරදෙන මෙන් ඉල්ලන ලොව පරිසරකාමීන්ගේ හඬටවත් ඇහුම්කන් නොදෙමිනි. ලොව දේශපාලන බල අරගලය මෙන්ම මහා පරිමාණයේ වෙළඳ අධිකාරියත් මෙම ගින්නට සෘජුවම වගකිව යුතු බව කාටත් රහසක් නොවේ. එය උපන් මෙන්ම නූපන් පරපුරද වනසමින් ඉදිරියට ඇදෙන මහා පරිමාණයේ වෙළඳ මාෆියාවකි. අනාගතයේදී ඔක්සිජන් නිපදවන වෙළඳ අධිකාරියක් බිහි වී මුදලට ලබා ගන්නා ඔක්සිජන් ටැන්කි පිට බැඳගත්, තාක්ෂණයෙන් අනූන ගමනාගමන සේවාවල, මොබයිල් ෆෝන් අත දරාගත් යන්ත්‍ර මිනිසුන් දැකගැනීමට හැකිවීම අහම්බයක් නොවන බව මේ වන විනාශයෙන් මනාවට පැහැදිලි වේ.





ඒ සමඟම අප උපන් රටේද වරින් වර වනාන්තර ගිනි ගැනීම අද වන විට සුලබ දසුනක් වී ඇත. මෑතක දී ගින්නෙන් දැවුණේ ඇල්ල කඳු ආශ්‍රිත වනාන්තරයයි. මේ සියල්ලටම සෘජුව හෝ වක්‍රව වගකිවයුත්තේ මහා පරිමාණයෙන් වනය විනාශ කරන, මිනිසත්කමට නිගා දෙන වෙළඳ මාෆියාවයි. මහා පරිමාණයෙන් කැලෑ කැපීම, ගල් කඳු පිපිරවීම, පස් වෙළඳාම වැනි පරිසර හානිකර වෙළඳාම් වල නියුතු දේශපාලන බලයේ ආශිර්වාදයෙන් කැලය අරක් ගත් වෙළඳ යක්ෂයන්ගෙන් පිරි ලොවක මේ කිසිත් නොදැන අකාලයේ මියයන අහිංසක මිනිසුන් හා සතුන් ප්‍රමාණය සුළු පටු නොවේ.

මේ වන විට ඕස්ට්‍රේලියාවේ ද ඉදිරියට උදාවන්නේ ග්‍රීස්ම සමයයි. දැඩි උෂ්ණත්වයක් පවතින ග්‍රීෂ්ම කාලය තුළ ලැව්ගිනි පැතිර යාම, ඕස්ට්‍රේලියානු මහාද්වීපය තුළ බොහෝ සුලබ දසුනකි. ප්‍රධාන වශයෙන් කැන්ගරු, වොලබි ආදී ශාක භක්ෂක සතුන් ජීවත් වන මේ වනය තුළ, මෙම අහිංසක සත්ව ප්‍රජාවට අත්වන ඉරණම සේම වනාන්තර ආශ්‍රිතව වගාවන්ගෙන් ජීවත්වන ගොවියන්ට අත් විඳින්නට සිදුවන දුක් කම්කටොලු බොහෝය. දැඩි උණුසුම් සුළං හැමීම තුළින් ඇතිවන ලැව්ගිනි සේම, මිනිසුන් විසින් කැලයට රිංගා කරන ජාවාරම් වලදීද ලැව්ගිනි ඇතිවීම සමාන්‍ය කරුණක් වන අතර, මේ සියල්ලන්ගෙන්ම විපතට පත් වන්නේ ජෛව ප්‍රජාවයි.

ලොව පරිසරය රැක ගැනීම වෙනුවෙන් සාහිත්‍යවේදීන්ට කළ හැකි කාර්යය භාරය සුළු පටු නොවේ. අප දරු පරපුරට වනාන්තර රැකගැනීම පිළිබඳව ගීතයෙන්, පතපොතෙන්, හා නාට්‍ය රංගනවලින් ද මනා අවබෝධයක් ලබා දිය හැක. ඕස්ට්‍රේලියාවේ ජීවත් වෙමින් වැසි වනාන්තර ආරක්‍ෂා කර ගැනීම පිළිබඳව නිර්මාණ කිහිපයක්ම මෙපුර ලාංකික ළමා පරපුරට දායාද කිරීමට මටද හැකියාව ලැබුණි. එම නිර්මාණ තුළින් බිහි වූ එක් නාට්‍යයක් වන්නේ "හඳ හාවට මොකද වුණේ " ළමා නාට්‍යයයි. එය සිංහල පාසල් පද්ධතිය වෙනුවෙන් පැරමටා පාසලේ දරු දැරියන් සමඟ එක්ව කළ නිර්මාණයකි. වනය විනාශ කරන මිනිසුන්ගේ වෙඩි පහර කට බිය වී බිමට වැටෙන හඳ හාවාට හමුවන අපූරු දරුවන් රැනක් පිළිබඳ කතාවකින් සැරසුණු ගීතමය නාට්‍යයක් වන එය තව තවත් ඔප මට්ටම් කර ඉදිරියටත් ප්‍රදර්ශනය කිරීමට නොහැකි වීම ගැන ඇත්තේ කණගාටුවකි. එලෙසම පරිසරය ආරක්‍ෂා කර ගැනීම වෙනුවෙන් මා අතින් නිර්මාණය වුණ තවත් ළමා කතාවක් වන්නේ "මේ අපේ ලොවයි." ළමා කතාවයි. මිනිසුන් විසින් ඇති කළ ගින්නකින්, ඕස්ට්‍රේලියානු වනයේ ජීවත් වන කැන්ගරු, වොලබි, පොසම්, වොම්බැට්, ආදී සතුන්ට මුහුණපාන්නට වන දුක් කරදර ආශ්‍රිතව නිර්මාණය කළ එම පොත් පිංච, ප්‍රවීන චිත්‍ර ශිල්පී තලංගම ජයසිංහගේ සිත්තම්වලින් විචිත්‍රවත් වූවකි. එය ලංකාවේ දරුවන්ට මෙන්ම මෙරට සිටින අපේම දරුවන්ට පරිසර විනාශයේ ආදීනව කියා දෙන ළමා කතාවකි. එහෙත් අවාසනාවකට එම කෘතියද අඩු තරමින් මෙරට ජීවත්වන අප දරුවන් අතරටවත් නොගියේ මන්දැයි මම තවම සිතමි. අවසානයේ මා එම පොත් තොගය ශ්‍රී ලංකාවේ තලවතුගොඩ සිංහ සමාජයට පරිත්‍යාග කලේ ලාංකික දරුවන්ට නොමිලේවත් බෙදා දෙන ලෙස ඉල්ලීමක් කරමිනි. එසේම ගොඩගේ, සරසවි, සුරස ප්‍රකාශකයන් බාරගත් පොත් විස්සක් තිහක් හැර අනෙක් කිසිඳු ප්‍රකාශකයෙක් ළමා කෘති බාර ගැනීමට මැලිකමක් දැක්වූහ.

ගහක් කොළක් රෝපණය කරන්නට, සතා සිව්පාවුන්ට ආදරය කරන්නට දරුවන්ගේ සිටම අප පුරුදු පුහුණු කළ යුතු දෙයකි. එහෙත් අද දවසේ බිහි වන්නේ ගහකට සතෙකුට ආදරය කරන දරුවන්ට වඩා, නිර්මාණශීලී බවෙන් කුසීත වූ තාක්‍ෂණයට ලැදි දරුවන්ය. මේ වගකීමෙන් මිදෙන්නට වැඩිහිටියන් වශයෙන් අපට කළ හැකි කාර්යභාරයද අද වනවිට යටපත් වී ඇති බව මම විශ්වාස කරමි. හුස්ම ගන්නට නොහැකි වූ විට මිය යන බව දන්නේ මනුෂ්‍යයන් පමණි. එහෙයින් පරිසරය අරක්‍ෂාකරගත හැක්කේ මනුෂ්‍යාටම පමණි. ළමා සාහිත්‍යය නිර්මාණ තුළින් යම් පමණකට හෝ පරිසර සංරක්ෂණය වෙනුවෙන් උරදීමක් සිදුකළ හැකි වේ නම් එයින් අප ලබන සතුට නොහොත් පින ඉමහත්ය. අවසාන වශයෙන් "මේ අපේ ලොවයි." ළමා කතාවේ අඩංගු කවි කිහිපයකට මා ඔබ දෙනෙත් යොම කරමි.

පින්න වැටී රිදියෙන් දිලිසෙයි
වොම්බැට්ලා තුරු මත සැතපෙයි

කැන්ගරු පොඩ්ඩෝ පැන පැන යයි
පොසම් පැට්ටෝ හැංගී හිනහෙයි
මායිම් නැති මේ අපේ ලොවයි
හෙවණ දෙන්නේ කැලේ ගහකොළයි
සරු තණපත් වලින් කුස පිරෙයි
වැහි දිය අපෙ පිපාසය නිවයි.

පුංචි පැටව් හරි අහිංසකයි
අම්මා තාත්තාටත් කීකරුයි
සුරැකුම්හල් නැහැ
වස කිරි පිටි නැහැ
අපි බොන්නේ මව් කිරිම තමයි
නිදාගන්නේ අම්මාගේ තුරුලෙයි
හොර මැරකම් නම් අපි නොදකියි
දුකට සැපට අපි අපිම තමයි

එකමුතු වී හැමදාමත්
තරහ නොවී කවදාවත්
අපි ඉන්නේ මේ වනයෙ තමයි
ගිනි තියන්න එපා සිසිල
මැරෙයි ලොවට නැතිව වතුර
අපේ ගැනත් හිතල නිතර
කැලේ රකිමු සැවොම මිතුර
හැමදාමත් සැමට උරුම කැලේ
රකිමු සැවොම මිතුර

## විනී හෙට්ටිගොඩ

